# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1907/4 - 2015 මාර්තු මස 23 වැනි සඳුදා - 2015.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**446 වැනි අධිකාරිය වූ උද්භිද උද්‍යාන ආඥාපනත යටතේ කෙරෙන නිවේදනය**

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 32 දරන පනත මගින් සංශෝධිත 446 වැනි අධිකාරිය වූ 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩමෙහි පිහිටි අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය වර්ෂ දෙදහස් පහලොවක් වූ මාර්තු මස 25 වැනි දින සිට ජාතික උද්භිද උද්‍යානයක් වශයෙන් ප්‍රකාශයට පත් කරමි.

නවීන් දිසානායක,
සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය.

2015 මාර්තු මස 18 වැනි දින,
සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

උපලේඛනය

අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ මායිම්,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහපත්තුව සුළු කොට්ඨාසයේ පන්නාගුල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/එච්.එන්.ඩබ්/07/280 හා 2007.09.13 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් මුල් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 32.6524ක් පමණ වන පන්නාගුලවත්ත පහත සඳහන් ප්‍රමාණයෙන් හා මායිම් වලින් යුක්ත ඉඩම් කොටස් දොළහ (12)ට මායිම්,

1. කැබලි අංක 01 - පන්නාගුලවත්ත - ප්‍රමාණය හෙක්. 4.9416ක් පමණ උතුරට ඃ මු. කො. පි. 871හි සඳහන් කැබලි අංක 8, මු. කො. පි. 8845හි කැබලි අංක 1, 2, 3, 4 සහ කැබලි අංක 2, නැගෙනහිරට ඃ කැබලි අංක 3, දකුණට ඃ කැබලි අංක 3 සහ රජය සතු පාර, බටහිරට ඃ රජය සතු පාර, අඩිපාර, කැබලි අංක 9, මේරි සුසාන පීටර් හිමිකම් කියන පන්නාගුලවත්ත සහ මු. පි. කො. 8715හි කැබලි අංක 8

2. කැබලි අංක 02 - ඇළ - ප්‍රමාණය ඃ හෙක්. 0.0076ක් පමණ



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. කැබලි අංක 03 - ප්‍රමාණය : හෙක්. 0.2628ක් පමණ උතුරට : මු. පි. කො. 8845හි කැබලි අංක 1 සහ කැබලි අංක 3, 4 සහ 9, නැගෙනහිරට : කැබලි අංක 4, දකුණට : කැබලි අංක 4 සහ රජය සතු පාර, බටහිරට : කැබලි අංක 1

4. කැබලි අංක 4 - පන්නාගුලවත්ත - ප්‍රමාණය : හෙක්. 21.6342ක් පමණ උතුරට : මු. පි. කො. 8845හි කැබලි අංක 3, 4, 9 සහ 10, නැගෙනහිරට : කැබලි අංක 5 සහ 6 මාර්ගය (මා. සං. අ.) බී. ඩී. රයිනා සහ තවත් අය හිමිකම් කියන රණවීර, කැන්දලන්දවත්ත, ඉලුක්ඕවිට කනිටු විද්‍යාලය, කැබලි අංක 10, 11 සහ මාර්ගය (මා. සං. අ.), දකුණට : කැබලි අංක 14, 13,12 සහ රජය සතු පාර, බටහිරට : රජය සතු පාර සහ කැබලි අංක 3

5. කැබලි අංක 5 - පන්නාගුලවත්ත - ප්‍රමාණය, හෙක්. 0.5015ක් පමණ උතුරට : මු. පි. කො. 8845හි කැබලි අංක 9 සහ 10, නැගෙනහිරට : මාර්ගය (මා. සං. අ.), දකුණට : කැබලි අංක 6 සහ 4, බටහිරට : කැබලි අංක 4

6. කැබලි අංක 6 - පන්නාගුලවත්ත - ප්‍රමාණය, හෙක්. 0.0981ක් පමණ උතුරට : කැබලි අංක 5, නැගෙනහිරට : මාර්ගය (මා. සං. අ.), දකුණට : කැබලි අංක 4, බටහිරට : කැබලි අංක 4.

7. කැබලි අංක 9 - ප්‍රමාණය, හෙක්. 0.0486ක් පමණ උතුරට : කැබලි අංක 4, 8 සහ මේරි සුසාන පීටර් හිමිකම් කියන පන්නාගුලවත්ත, නැගෙනහිරට : කැබලි අංක 1, දකුණට : කැබලි අංක 1, බටහිරට : අඩිපාර, කැබලි අංක 7 සහ 8

8. කැබලි අංක 10 - ප්‍රමාණය, හෙක්. 0.0619ක් පමණ උතුරට : ඉලුක්ඕවිට කනිටු විදුහල, නැගෙනහිරට : මාර්ගය (මා. සං. අ.), දකුණට : කැබලි අංක 11, බටහිරට : කැබලි අංක 4

9. කැබලි අංක 11 - පන්නාගුලවත්ත - ප්‍රමාණය, හෙක්. 0.5107ක් පමණ උතුරට : කැබලි අංක 10, නැගෙනහිරට : මාර්ගය (මා. සං. අ.), දකුණට සහ බටහිරට : කැබලි අංක 4

10. කැබලි අංක 12 - පන්නාගුලවත්ත - ප්‍රමාණය, හෙක්. 0.4876ක් පමණ උතුරට : කැබලි අංක 4, නැගෙනහිරට : කැබලි අංක 4 සහ 13, දකුණට සහ බටහිරට : රජය සතු පාර.

11. කැබලි අංක 13 - පන්නාගුලවත්ත - ප්‍රමාණය, හෙක්. 4.0340ක් පමණ උතුරට : කැබලි අංක 4 සහ 14, නැගෙනහිරට : කැබලි අංක 14 සහ මාර්ගය (මා. සං. අ.) , දකුණට : රජය සතු පාර, බටහිරට : රජය සතු පාර සහ කැබලි අංක 12 සහ 14

12. කැබලි අංක 14 - ඇළ - ප්‍රමාණය, හෙක්. 0.0638ක් පමණ සහ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගහපත්තුව සුළු කොට්ඨාසයේ, ඉලුක්ඕවිට නමැති ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද සීඕ/එච්එන් ඩබ්ලිව්/98/117 හා 1998.11.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 10.1180ක් පමණ වූ පන්නාගුලවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්,

    1. කැබලි අංක 1 - පන්නාගුලවත්ත - ප්‍රමාණය, හෙක්. 10.118ක් උතුරට : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් පන්නාගුලවත්ත, යූ. එච්. සයිමන් හිමිකම් කියන ඊසාදෙණිය, යූ. එච්. ජයලතා සහ තවත් අය හිමිකම් කියන පන්නාගුලවත්ත, නැගෙනහිරට : මහා මාර්ගය සහ පුස්සැල්ලාව වැවිලි සමාගම හිමිකම් කියන පන්නාගුලවත්ත , දකුණට : පුස්සැල්ලාව වැවිලි සමාගම හිමිකම් කියන පන්නාගුලවත්ත, බටහිරට : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති පන්නාගුලවත්ත.

04-223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.